## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

අංක 1971/17 දරන 2016.06.15 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් හා අංක 2032/33 දරන 2017.08.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත, අංක 1880/26 දරන 2014.09.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3.වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3.1 වගන්තිය අනුව සපුරාලිය යුතු සුදුසුකම් හා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති පරිදි විශේෂ ශ්‍රේණියේ තනතුරු අයත් ධාරාවන් හා එම තනතුරු සඳහා අයදුම් කල හැකි නිලධාරීන් අයත් විය යුතු ධාරාවන් පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත. ඒ අනුව සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට මෙයින් කටයුතු කරනු ලැබේ.

2.1 **විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්:-**

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම. ***(ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් වීම සඳහා අදාල කරගත් පශ්චාත් උපාධියක්, මෙම උසස්වීම සඳහා අදාල කරගත නොහැක)***

ii. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම.

iii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට, සුදුසුකම් ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ වසර දහ අටකට (18) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම
***(මෙම අවස්ථාවට පමණක් III වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීම වන සුදුසුකම, විශේෂ ශ්‍රේණියේ උසස්වීම් ලබා දීමේ දී සලකා නොබැලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත)***

vii. අයදුම්කරුවෙකු විසින් ඔහු හෝ ඇය ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන තනතුර අයත් ධාරාව යටතේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ තනතුරකට පත් කරනු ලැබ තිබිය යුතුය. පුරප්පාඩුව පවතින තනතුරු අයත් වන ධාරාව/ධාරාවන් පහත සඳහන් කර ඇත.

| ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අදාළ වන තනතුරු නාම | අදාළ ධාරාව/ධාරා | පුරප්පාඩු වූ දිනය |
|---|---|---|
| අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂි සංවර්ධන/කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | 2016.03.12 |
| අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂි සංවර්ධන/කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | 2017.07.24 |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂි සංවර්ධන/කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | 2018.02.09 |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්(සංවර්ධන) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂි සංවර්ධන ධාරාව | 2017.02.28 |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්(පර්යේෂණ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | 2017.11.12 |

03. උසස් කිරීමේ ක්‍රමය:-

3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් (03) සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කරනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමකින් අනතුරුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කරන අතර, ඒ සඳහා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ජ්‍යෙෂ්ඨත්වය පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

3.2 නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පිළිබඳ සමස්ථ ඇගයීම පදනම් කරගෙන විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලබන අතර, එක් එක් උසස්වීම් දිනට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛණය, එම එක් එක් දිනයන්ට උසස්වීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස් වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සැකසේ.

04. පුරප්පාඩුව ඇති වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා උසස්වීම කරනු ලබන අතර, අයදුම්කරුවන් විසින් මූලික සුදුසුකම් එක් එක් පුරප්පාඩු දිනට සම්පූර්ණ කල යුතුවේ. ඔබ විසින් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින් 2018.07..31. දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර, සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ලකුණු පරිපාටියේ පිටපතක් මේ සමඟ අමුණා එවා ඇත.

05. ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් , අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටින අතර, දැනට විශ්‍රාම ගෙන සිටියේ වුව ද , ඉහත පරිදි උසස් කිරීමට නියමිත දිනය තෙක් සේවයේ යෙදී සිටි, උසස්වීම් ලැබීමට ඉහත 2.1 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් හට මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

.......................................

බී. විජයරත්න,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය

බී. විජයරත්න
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත
රාජගිරිය

දිනය:- 2018.07....12....